දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තා සමගින් හදිසි උපකාරක අංක සඳහන් කිරීම නිත්‍ය මාධ්‍ය භාවිතාවක් වීම යෝග්‍ය යැයි දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශයන් තුළ දැක්වේ. මන්දයත්, එසේ හදිසි උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුවකින් යුක්ත තවත් අයෙකුගේ දිවි ගලවා ගැනීමට ඉඩක් ලැබිය හැකි බැවිනි.

දිවි තොර කරගැනීම් පිළිබඳව වාර්තා කරන ශ්‍රී ලංකාවේ මුද්‍රිත සහ රූපවාහිනී පුවත් වාර්තාවන් සමගින් හදිසි උපකාරක අංක පළ කරන මෙන් Ethics Eye නැවත නැවතත් අවධාරණයෙන් පැවසීමට හේතුවද එයම වේ.

කෙසේ හෝ, පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරියෙකු දිවි තොර කරගත් සිදුවීමක් වාර්තා කරන Adaderana.lk අඩවිය, ඒ සමගින් හදිසි උපකාරක අංක පළ කර තිබේ. මෙය සැබවින්ම ප්‍රශංසා කටයුතු වේ. මෙය සියළුම මාධ්‍ය තුළ ස්ථිර භාවිතාවක් වනු ඇතැයි Ethics Eye අපි උදක්ම බලාපොරොත්තු වෙමු.

කෙසේ වෙතත්, මෙහි සිරස්තලයේ සඳහන් වන "Commits suicide" වැනි යෙදුම් භාවිතයෙන්ද වැළකිය යුතු බවද අපි මෙසේම පවසමු. මන්දයත්, ඒ ඔස්සේ දිවි තොර කරගැනීම අපරාධකාරී ක්‍රියාවක් ලෙසින් චිත්‍රණය වන බැවිනි.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

**#MediaEthicsSL** **#lka** **#sinhalanews** #AdaDerana.lk